ශීර්ෂය 10- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

---

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** තත්ත්වාගණනය නොකළ මතය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.**

**මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.2** තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.**

**ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා**

**ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.**

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

**සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.**

**මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,**

- **වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.**
- **අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.**
- **හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.**
- **සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,**

**මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.**

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) **අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.**

(ආ) **අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.**

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අධිප්‍රතිපාදන සලසා තිබීම. | | |
| වැය විෂයයන් 08 ක් සඳහා රු.මිලියන 64.25 ක අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයන්ගෙන් උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 64 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. | අක්මුදල් ප්‍රමාණවත් නොවීම, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරන ලද කොන්ත්‍රාත්තුව අදාල කාලය තුල නිම කිරීමට අපොහොසත් වීම හා බිල්පත් නිසි කලට නොලැබීම හේතුවෙන් ගෙවීම් කිරීමට නොහැකි විය. |
| (ආ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම. | | |
| සමාලෝචිත වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් රු.11,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයේ දී එම වැය විෂයයේ රු .3,436,899 ක් ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. | පසුගිය වසරේ රටේ ඇති වූ දේශපාලනික ව්‍යාකූලතාවය හේතුවෙන් අදාල විදේශ සමුළු නොපවත්වන ලදි. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි අනුකූල නොවීම** | | |

| | | | | |
|---|---|---|---|---|
| | වලට යොමුව | | | |
| | (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **3 මෙහෙයුම් සමාලෝචනය** | (i) මුදල් රෙගුලාසි 137(3) | විදුලිය නඩත්තු කටයුතු වෙනුවෙන් විදුලිබල මණ්ඩලයට ගෙවීම් සිදු කිරීමේදී ආයතනය විසින් කම්කරු හා පොදු කාර්ය පිරිවැය පිළිබද සැලකිලිමත්වීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි 137(3) ප්‍රකාරව ගෙවීම් කළ යුතුවීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේ ගත වන මිනිස් පැය ගණනය කිරීමට ලේඛනයක් නඩත්තු කිරීමට පියවර ගනු ලැබේ. |
| | (ii) මුදල් රෙගුලාසි 211 | කොමිෂන් සභාවේ විදුලි බිල්පත් ප්‍රමාද වී ගෙවා තිබීම හේතුවෙන් විදුලිබල මණ්ඩලයට රු.45,415ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි 211 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අත්මුදල් ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් මෙය සිදුව ඇත. |
| | (iii) මුදල් රෙගුලාසි 104 | 2018 සැප්තැම්බර් මාසයේදී අනතුරට ලක්ව තිබුණු කොමිෂන් සභාවේ වාහන 02 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක හෝ පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එක් වාහනයක් සඳහා ප්‍රාරම්භක වාර්තාවක් සකසා ඇති අතර අනෙක් වාහනය සඳහා පරීක්ෂණ මේ වන විට ආරම්භ කර ඇත. |
| | (ආ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ගර්භිත වූ වාහන අපහරණය කර නොතිබුණි. | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු විය. | නිරීක්ෂණය හා එකඟ වෙමි. අපහරණ කටයුතු සිදු කෙරෙමින් පවතී. |

-----

3.1 **සැලැසුම් කිරීම**

**----------------**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාළව කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුළ ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව, එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ප්‍රතිඵල ඇස්තමේන්තු හා සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන සටහන ඇතුළත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වීම. | ඉදිරි වර්ෂවලදී මෙම අඩුපාඩුවලින් තොර ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. |

3.2 **කාර්යභාරයන් ඉටු නොකිරීම**

**------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කරන බවට ඉලක්ක පිහිටුවා තිබුණද, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 03ක, සහකාර අධ්‍යක්ෂ තනතුරු 02ක හා සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු 11ක් ඇතුළුව තනතුරු 15ක පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 03න් 01ක් පුරවා ඇත. සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් නොමැති අතර ඒ සඳහා අයදුම්පත් කැඳවීමට කටයුතු කරමින් පවතී. සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| (ආ) පැරණි ගොඩනැගිල්ල ඉවත් කිරීම හා බන්ධනාගාර කොමසාරිස් නිල නිවස පැවති ඉඩමේ නව ගොඩනැගිල්ල ඉදි | ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | පැරණි ගොඩනැගිල්ල ඉවත් කිරීමට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතී. පැරණි ගොඩනැගිල්ල ඉවත් කිරීම කිරීමෙන් පසුව නව |

| | | | |
|---|---|---|---|
| | කිරීම යන කාර්යයන් සැලැසුම් කළ පරිදි සිදු කර නොතිබුණි. | | ගොඩනැගිල්ල ඉදිකිරීම සිදු කෙරෙනු ඇත. |
| (ඇ) | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව 2018 සැප්තැම්බර් 15 දින වැඩ නිම කිරීමට නියමිතව තිබුණු නව ආරක්ෂක තාප්පය ඉදි කිරීමේ කාර්ය ඉටු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | මෙම කාර්ය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් මිල ගණන් කැඳවා ඇත. |
| (ඈ) | රථගාල නවීකරණය කිරීම සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |

3.3 **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**--------------------------------**

**පහත සඳහන් නිරීක්‍ෂණය කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ------------------------------- |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය හා 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය. | වාර්ෂික වාර්තාව පිළියෙල කර ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. |

3.4 **ප්‍රසම්පාදනයන්**

**-----------------**

**පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ------------------------------ |
| (අ) | කොමිෂන් සභාව විසින් යතුරු පැදි 10ක් මිල දී ගැනීමට අදාළව අවම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු | යතුරු පැදි භාවිත කිරීමට නියමිත අංශවලින් එම යතුරු පැදි සම්බන්ධයෙන් ලබා දී තිබුණු නිර්දේශ තාක්ෂණික |

| | | | |
|---|---|---|---|
| | හේතුව ලංසු ඇගයීමේ වාර්තා තුළ සඳහන් කර නොතිබුණි. | වීම. | ඇගයීමේ කමිටුව සලකා බලා ඇත. |
| (ආ) | ලැප්ටොප් පරිගණක යන්ත්‍ර මිල දී ගැනීමට අදාළ මිල විවෘත කිරීමේ කමිටු වාර්තාවෙහි එම කමිටුවේ සභාපති විසින් අත්සන් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රමාද දෝෂයකින් අත්සන යෙදීමට නොහැකි වී ඇත. |
| (ඇ) | කොමිෂන් සභාවේ කාර්යාල ගෘහ භාණ්ඩ මිල දී ගැනීමට අදාළ මිල විවෘත කිරීමේ කමිටු වාර්තාවෙහි එක් සාමාජිකයෙකු පමණක් අත්සන් කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අනෙකුත් සාමාජිකයින් නොසිටීම හේතුවෙන් එක් සාමාජිකයෙකු ඉදිරියේ මිල ගණන් විවෘත කරන ලදී. |
| (ඈ) | කොමිෂන් සභාවේ කාර්යාල ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ලංසු ඇගයීමේ වාර්තාවේ ප්‍රතික්ෂේප කළ ලංසුකරුවන්ගේ නම් සහ ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකග වෙමි. |

3.5 **පාඩු හා හානි**

**--------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 අප්‍රේල් මාසයේදී අනතුරට ලක්ව තිබූ මෝටර් රථයකට සිදු වූ අලාභයෙන් රියදුරාගෙන් අය කර ගැනීමට තීරණය කරන ලද රු.11,371 ක් 2019 මැයි මාසය වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අලාභය අයකිරීමට කටයුතු කළ යුතු වීම. | රියදුරා මේ වන විට ප්‍රදේශය අතහැර යාපනය ප්‍රදේශයට ගොස් ඇති අතර ඔහු සිටින ලිපිනය සොයාගත් වහාම අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 2018 සැප්තැම්බර් මාසයේදී | පාඩු පිළිබඳ ප්‍රකාශයේ | අලාභය නිසි ලෙස තක්සේරු |

| | | |
|---|---|---|
| අනතුරට ලක්ව තිබූ කොමිෂන් සභාවේ වාහන 02ක් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සදහන් කර නොතිබුණි. | සදහන් කළ යුතුවීම. | කර නොතිබීම හේතුවෙන් එහි ඇතුළත් නොකරන ලදි. |

**4 තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනිම**

**පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ලඟාකර ගත යුතු අරමුණු හා ඉලක්ක කරා ලඟා වීම පිළිබඳව පරීක්ෂා කිරීමේදී කොමිෂන් සභාව විසින් තිරසර අරමුණු සංවර්ධනය පිළිබඳ අරමුණු හඳුනා ගැනීමට අදාළ සැලැසුම් සකස් කිරීම, සහ ඉලක්ක කරා ලඟා වීම හා මැනිය හැකි දර්ශක හා සංරචක හඳුනා ගැනීමට 2018 වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි. | තිරසර අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට අවශ්‍ය සැලැසුම් සකස් කර ඒවා ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුවීම. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ආයතනය සූදානම් කිරීම පිළිබඳ සාකච්ඡා මෙතෙක් ආරම්භ වී නොමැති අතර ඒ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලෙස තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කරන ලදී. |